යම් කිසි පුවතකට සෘජුවම අදාළ නොවනා වාර්ගිකත්වයක් පුවත් වාර්තාවන් තුළ සෘණාත්මකව භාවිතා කිරීමේ ඇති ගැටළුව වන්නේ, ඒ ඔස්සේ යම් වාර්ගිකත්වයකට අයත් ප්‍රජාවක්ම පොදුවේ සෘණාත්මක ලෙසින් ඒකාකෘතික වීමට (negatively stereotype) සහ කොන් කිරීමට ලක් වීමට ඉඩ කඩ තිබීමයි. පුවතකට සෘජුව අදාළ නොවන්නේ නම් වාර්ගිකත්වයන් සඳහන් නොකරන ලෙසින් මාධ්‍ය ආචාර ධර්ම තුළ පැවසෙන්නේ ද ඒ හෙයිනි.

එසේ නම්, ඔබ සිතනා ලෙසට මෙම පුවත තුළ,

1) "මුස්ලිම්" යනුවෙන් එක් අයෙකුගේ වාර්ගිකත්වයක් පමණක් සෘණාත්මකව ඉස්මතු කොට දැක්වීම පුවතට අවශ්‍ය ද?

2) එම පුවත තුළ සඳහන් කෙරෙනා අනෙකුත් පුද්ගලයන්ගේ වාර්ගිකත්වයන් එසේ විශේෂ කොට දක්වා නොමැත්තේ මක් නිසාද?

3) එසේ නම්, මෙසේ එක් වාර්ගිකත්වයක් සෘණාත්මක පසුබිමක ඉස්මතු කොට සඳහන් කිරීම මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයක් නොවන්නේ ද?

අදාළ නොවන තැන වාර්ගිකත්වයන් ඉස්මතු නොකරමු!